www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ බෞද්ධ අන්තවාදීහු මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන වලට පහර දෙති

## Sri Lankan Buddhist extremists attack Muslim-owned businesses

**ඩබ්ලිව්.ඒ. සුනිල් හා දේහින් වසන්ත විසිනි**
**2013 අප්‍රේල් 02**

බොදු බල සේනාවට අයත් බවට හඳුනාගෙන ඇති භික්ෂූන් විසින් මෙහෙයවන ලද බෞද්ධ අන්තවාදීහු, මාර්තු 28දා පැපිලියානේ මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන දෙකකට පහරදී අලාභ හානි කලහ. ඔවුහු පලමුව එමරල්ඩ් වෙලඳ ආයතනයේ ගොඩනැගීම් යන්ත්‍රෝපකරන අංගනයකට ද පසුව ෆැෂන් බග් ඇඟලුම් සමූහයේ ප්‍රධාන කාර්යාලයට හා ගබඩාවට ද පහර දුන්හ.

මුස්ලිම් ප්‍රජාවට එරෙහිව සිංහල-බෞද්ධ අන්තවාදීන් මෙතෙක් සිදු කල ප්‍රචන්ඩතම පහරදීම මෙයයි. මීට පෙර රාවනා බලකාය හා සිංහල රාවය ද ඇතුලු කන්ඩායම් ගනනාවක් මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන ඉදිරිපිට උද්ඝෝෂනය කිරීමට ප්‍රකෝපකාරීන් උසිගන්වා ඇති අතර පාරිභෝගිකයින් අවහිර කිරීම පිනිස කායිකව මැදිහත්වූහ. එම සිදුවීම් වලට තමන් සම්බන්ධ නැති බව බොදු බල සේනා කියා සිටිය ද එය මුස්ලිම් විරෝධී ප්‍රචාරයන්ට විස කවන ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීය.

එමරල්ඩ් සමාගමේ අයිතිකරු මුර්සි අහමඩ් සාදූන්ට අනුව, රාත්‍රී 8.10ට පමන ඔහුගේ ව්‍යාපාරික ස්ථානයට පහරදී ඇත. "ඔවුන් අංගනයේ නවතා තිබූ සියලුම වාහන වලට හා උපකරන වලට ගල් ගැසුවා" යයි ඔහු පැවසීය. සිදුව ඇති අලාභය අඩුම තරමින් රුපියල් මිලියන 10 (ඇමරිකානු ඩොලර් 78,900) ඉක්මවනු ඇතැයි ද ඔහු පැවසීය.

ෆැෂන් බග්හි ගොඩනැගිල්ලේ ඉදිරිපස වීදුරුවට හා ඉදිරිපස නවතා තිබූ ට්‍රක් රථයකට ද අලාභ හානි සිදුව ඇත. එහි රියදුරුට බරපතල තුවාල සිදුව ඇති අතර එම ස්ථානයෙන් පිටවෙමින් සිටි බොහෝ කම්කරුවන්ට පහරදී තිබුනි. එම සිදුවීම ආවරනය කිරීමට පැමිනි මාධ්‍යවේදීන් ද මැර නඩයේ ප්‍රහාරයට ලක්විය. හිරු ටීවී නාලිකාවේ මාධ්‍යවේදියෙකුට බරපතල තුවාල සිදුකර තිබුනි.

සාදූන් පොලිස් හදිසි ඇමතුම් අංකය වන 119ට වහාම කථාකල ද පොලිසිය පැමිනියේ නැත. මැර කන්ඩායම ප්‍රමානයෙන් විශාල වන විට ආධාර පතා කිලෝමීටරයක් පමන දුරින් ආසන්නයේම පිහිටි කොහුවල පොලිස් ස්ථානය වෙත යාමට ඔහුට බල කෙරුනි. බොහෝ සාකච්ඡා වලින් පසුව පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් තමන්ගේම වාහනයෙන් ප්‍රහාරය සිදුවූ තැනට රැගෙන යන ලෙස ඔහුට දැනුම් දෙන ලදී.

මෙම ප්‍රහාරයට කඩතුරාව කරගෙන තිබුනේ, එමරල්ඩ් සමාගමේ තරුන මුස්ලිම් සේවකයෙකු හා ප්‍රදේශයේ 15 හැවිරිදි සිංහල ගැහැනු ලමයෙකු අතර පැවති ප්‍රේම සම්බන්ධයකි. මැර ප්‍රහාරයට කලින් දිනයේ ගැහැනු ලමයා දූෂනය කලාය යන චෝදනාව යටතේ තරුනයා අත්අඩංගුවට ගෙන තිබුනි.

"මම මුස්ලිම් අයෙකු වුවත් ඉගෙනගත්තේ සිංහල පාසැලකයි. මට බොහෝ සිංහල මිතුරන් සිටිනවා. අප සියලු දෙනාම ශ්‍රී ලාංකිකයෝ. මෙවැනි දේ සිදුවන්නේ කුමක් නිසාදැයි මට තේරුම් ගන්න බැහැ." සාදූන් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසුවේය.

ව්‍යාපාරයේ ඉඩම අයිති සිංහලයෙකු වන නන්දන පෙරේරා ප්‍රහාරය හෙලා දුටු අතර ආසන්නයේ පිහිටි සුනේත්‍රාදේවි පිරිවෙනේ භික්ෂූන්ට චෝදනා කලේය. පෙරේරා *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසීය. "මම පන්සලේ ලොකු හාමුදුරුවන්ට කෝල් එකක් දීලා කිව්වා ඔබ වහන්සේලා මේ කරලා තියෙන්නේ අපි දෙන දානෙ පිඟානට ගල් ගැහීමක් වගේ වැඩක් කියලා."

පුරුදු පරිදිම බොදුබල සේනා මෙම ප්‍රහාරයට තමන්ගේ සම්බන්ධයක් නැතැයි පැවසුවේය. එහෙත් ඇසින් දුටුවන්ට අනුව ප්‍රහාරයට පැය කිහිපයකට පෙර මැරයින්, පිරිවෙන් භූමිය තුලට රැස්වී ඇත. පිරිවෙනාධිපති මැදගොඩ අබේතිස්ස හිමි බොදුබල සේනාවේ ප්‍රබල සාමාජිකයෙකු වන අතර එහි මුස්ලිම් විරෝධී ප්‍රසිද්ධ උද්ඝෝෂනයන්හි දී ප්‍රධාන භූමිකාවක් ඉටු කර ඇත.

කලම්බු ටෙලිග්‍රාෆ්හි වීඩියෝ පටයක, පොලිසිය බලා සිටියදී ම භික්ෂුවක් එම ගොඩනැගිලි පරිශ්‍රය තුල පිහිටි සීසීටීවී කැමරාවට ගල් ගසුනු දැකගත හැකිවිය.

මෑත සතිවලදී බොදුබල සේනා සිය වාර්ගික උද්ඝෝෂන උත්සන්න කර ඇත. පානදුරේ හා මහනුවරදී පැවැත්වූ ප්‍රසිද්ධ රැස්වීම් දෙකකදී බොදුබල සේනා, මුස්ලිම් ව්‍යාපාරිකයන් සතු ෆැෂන් බග් හා නෝ ලිමිට් යන ඇඟලුම් ව්‍යාපාර සමූහය වර්ජනය කරන ලෙස සිංහල ජනතාවගෙන් ඉල්ලා සිටියේ ය.

මාර්තු 17දා පැවති මහනුවර රැස්වීමේදී බොදුබල සේනා ප්‍රධාන ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර, "සිංහල තරුනයින් සූරාකන බවට හා සිංහල ගැහැනු ලමුන් ලිංගික අපචාරයේ යොදවන" බවට ෆැෂන් බග් හා නෝ ලිමිට් ආයතනවලට චෝදනා කලේය.

මුස්ලිම් ව්‍යාපාර හිමිකර ගැනීමට කුරුමානම් අල්ලන වෙලඳුන් ද ඇතුලු මංමුලා සහගත සිංහල මධ්‍යම පන්තිය අතර මුල්බැසගත් බොදුබල සේනා, තමන් නිල නොවන පොලීසිය බවත් "සිංහල-බෞද්ධ උරුමය" ආරක්ෂා කිරීමට ඕනෑම දෙයක් කිරීමට නොපසුබට වන බවත් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත.

බොදුබල සේනා ආන්ඩුවේ නිහඬ සහාය ලබයි. මේ වසර මුල ජනාධිපති මහින්ද රාජපක්ෂ, අරලියගහ මන්දිරයේදී බොදුබල සේනා නායකයින් හමුවූ අතර බුද්ධාගම ආරක්ෂා කිරීමට ඔවුන් දෙන ප්‍රතිඥාවට සහාය පල කලේය. ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, පසුව බොදුබල සේනාහි නායකත්ව පුහුනු මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවයට සහභාගී විය.

ප්‍රමාදවී පැමිනීමෙන් පසුව වුවත්, ප්‍රහාරය නතර කිරීමෙහිලා පොලිසියේ කිසිදු මැදිහත්වීමක් නොකල හෙයින් පැය දෙකකට වැඩි කාලයක් එය පැවතුනි. මාධ්‍ය වාර්තාවන්ට අනුව, පොලිස් විශේෂ කාර්ය බලකාය හා මිලිටරිය යොදවා අවසානයේදී මැරයින් විසුරුවා හරිනු ලැබුවේ, සමහර මුස්ලිම් දේශපාලඥයින්ගේ බලකිරීම් හමුවේ ජනාධිපති මැදිහත්වීමෙන් පසුව පමනි.

පොලිසිය කිසිවෙකුත් ඒ අවස්ථාවේදී අත්අඩංගුවට ගත්තේ නැත. මෙම ප්‍රතිචාරය, කම්කරුවන්, තරුනයින් හා පීඩිතයින්ගේ විරෝධතාවන්ට එරෙහිව ජල විදින, කඳුලු ගෑස්, බැටන් ප්‍රහාර හා ජීව උන්ඩ පවා යොදාගත් අවස්ථාවන්ට වඩා මුලුමනින්ම වෙනස් එකකි. ආන්ඩුවේ විශ්‍රාම පනතට එරෙහිව කටුනායක නිදහස් වෙලඳ කලාපය තුල 2011 මැයි මාසයේ පැවති විරෝධතාවයේදී පොලිස් වෙඩි තැබීමෙන් එක් අයෙක් මිය ගියේය. පසුගිය වසරේ පෙබරවාරියේදී ඉන්ධන මිල ඉහල දැමීමට එරෙහිව හලාවතදී පැවති විරෝධතාවේදී පොලිසිය එක් ධීවරයෙකු මරා දමා තවත් ගනනාවකට බරපතල තුවාල සිදු කලේය.

රාජපක්ෂ ආන්ඩුව බොදුබල සේනා හා අනෙකුත් වර්ගවාදී බෞද්ධ සංවිධාන පෝෂනය කරන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අන පරිදි ආන්ඩුව ගෙන ඇති කප්පාදු පියවරයන්ට මහජනතාවගේ විරෝධය වර්ධනය වෙද්දී කම්කරු පන්තිය හා පීඩිත ජනයා වාර්ගික රේඛා ඔස්සේ බෙදාලීමේ අරමුන ඇතිවය.

ආන්ඩුව විසින් වර්ගවාදය ඇවිස්සීම, පාලක පන්තියේම සමහර කොටස්වල විවේචනයට ලක්ව ඇත. එය වඩාත් පුලුල් දේශපාලන හා සමාජ නොසංසුන්තාවකට තුඩුදෙනු ඇතැයි ඔවුහු කනස්සල්ලට පත්ව සිටිති."මුස්ලිම් විරෝධතා පාලනයෙන් පිට පැන ඇති අතර රට ව්‍යසනයක් කරා ඇදී යමින් තිබෙන" බව රාජපක්ෂගේ ප්‍රබල ආධාරකරුවෙකු වන අයිලන්ඩ් පුවත්පත මාර්තු 31දා කතුවැකියෙහි සඳහන් කලේය.

කල් පසුවී නමුත් පසුගිය සතියේ ප්‍රහාරයට සම්බන්ධ බෞද්ධ භික්ෂූන් තිදෙනෙක් හා තවත් 14 දෙනෙක් අත්අඩංගුවට ගැනීමට නියෝග කරමින්, රාජපක්ෂ ආන්ඩුව දැනට විවේචන යටගැසීමේ උත්සාහයක නිරතව සිටී. එහෙත් සිංහල පාලක පන්තියේ දිගු වාර්තාව පෙන්නුම් කරන්නේ, වැඩකරන ජනතාවගේ අභියෝගයට ලක්වන්නේ යයි තමන්ට හැඟී යන සෑම අවස්ථාවකදීම ඔවුන් යලි වර්ගවාදය කරපින්නා ගන්නා බවයි.

ගෝලීය ආර්ථික අර්බුදයේ බර පැටවීමේ අරමුන ඇතිව ආන්ඩුව විසින් ප්‍රයෝජනයට ගැනෙනු ඇති බොදුබල සේනා හා එවැනි තවත් සංවිධානවල හිස එසවීම තමන්ට එරෙහිව යොදා ගනු ඇති බිහිසුනු ක්‍රමවේදයන් පිලිබඳව වැඩකරන ජනතාවට කෙරෙන ප්‍රබල අනතුරු ඇඟවීමකි. කම්කරුවන් හා තරුන ජනතාව, සියලු ආකාරයේ වර්ගවාදයන්ට එරෙහි වෙමින්, සමාජවාදී පිලිවෙත් ක්‍රියාවට නගන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා කරන අරගලය තුල සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන්ගේ එකමුතුව සඳහා සටන් වැදිය යුතුය.

© www.wsws.org